**ගොවීන්ගේ භාරකාර අරමුදල - 2016**
**-----------------------------------------------**

ගොවීන්ගේ භාරකාර අරමුදලේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1994 මාර්තු 09 දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ අරමුදලේ භාරකරුවන් අතර එළඹි භාරකාර ඔප්පුවේ 18 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (3) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. යථෝක්ත මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

**----------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810 ) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුලත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාචෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම.

**----------------------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

------------------

### 2.1 තත්ත්වාගණනය කළ මතය

--------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට ගොවීන්ගේ භාරකාර අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

----------------------------------------

#### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු.

------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වගා ළිඳක් ඉදිකිරීම සඳහා පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් මඟින් සමාලෝචිත වර්ෂයේදී ලබාදුන් රු.100,000 ක අත්තිකාරම් මුදල පියවීමේ දී එය පූර්ව වර්ෂ ගැලපුම් යටතේ පෙර වර්ෂයේ ලාභයට ගලපා තිබුණු බැවින් සමාලෝචිත වර්ෂයේ අතිරික්තය රු.100,000 කින් අඩුවී තිබුණි.

(ආ) 2014 වර්ෂයේදී මහනුවර වෙඩරුව ගොවිජන සේවා මධ්‍යස්ථානයේ පොහොර ගබඩාවක් ඉදිකිරීමට පළමු අදියර යටතේ ලබාදුන් රු.315,000 ක අත්තිකාරම් මුදල පියවීමේ දී පියවීම් ජර්නල් වවුචරය දෙවරක් සටහන් කර තිබීම හේතුවෙන් සමුච්චිත අරමුදල හා අත්තිකාරම් ගිණුමේ ශේෂය ඉහත වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.

### 2.3 ලැබිය යුතු ගිණුම්

---------------------

වර්ෂ 3 සිට වර්ෂ 15 දක්වා වු කාලච්ඡේදයට අයත් ණය වර්ග 5 කට අදාල රු.140,177,028 ක ණය ශේෂ 16 ක් 2016 දෙසැම්බර් 31 දිනට පැවති අතර, එම ණය ශේෂ අයකර ගැනීම සම්බන්ධයෙන් 2014 වර්ෂයේ පත්කළ ණය සමීක්ෂණ මණ්ඩලය නිර්දේශ ඉදිරිපත් කර තිබූ නමුත් එම ණය ශේෂ 2017 ජූලි 25 දින වන විටත් අයකරගෙන නොතිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

------------------------

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අරමුදලේ මූල්‍ය ප්‍රතිඵලය රු.32,499,321 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.10,311,493 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.22,187,828 ක වර්ධනයක් නිරීක්ෂණය විය. සංවර්ධන වියදම් රු.23,933,954 කින් අඩුවීම ඉහත වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2014 වර්ෂය හැර අනෙකුත් වර්ෂයන්හිදී මූල්‍ය අතිරික්තයක් ඇතිවී තිබුණි. කෙසේ වුවද මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික, ආදායම් බදු හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂයවීම් නැවත ගැලපීමේදී 2012 වර්ෂයේ රු.219,305,053 ක් වූ ආයතනයේ දායකත්වය 2013 වර්ෂයේදී සියයට 94 කින් අඩු වී තිබූ අතර 2014 වර්ෂයේදී රු. 9,954,152 ක සෘණ අගයක් වී තිබුණි. නැවත 2015 හා 2016 වර්ෂයන්හිදී පිළිවෙලින් රු.11,795,697 ක හා රු.34,591,280 ක අඛණ්ඩ වැඩිවීමක් පෙන්නුම් කෙරුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

----------------------------

### 4.1 කාර්යසාධනය

-----------------

මෙරට ගොවි ජනතාවගේ කෘෂිකාර්මික සංවර්ධනය හා සුභසාධනය වැඩිදියුණු කිරීම, සුළු ගොවීන් සඳහා කෙටි කාලීන කෘෂිකාර්මික ණය පහසුකම් සැපයීම, සුළු ගොවීන් සඳහා කෘෂි යෙදවුම් සම්පාදනය, මුදල් දුෂ්කරතාවයන් මග හරවා ගැනීම සඳහා සුළු ගොවීන්ට වෙළඳපොළ ණය පහසුකම් සැලසීම, සුළු ගොවීන්ගේ කෘෂිකාර්මික සංවර්ධනය හා සුභසාධනයට අදාලව දැනුවත් කිරීම, ප්‍රදර්ශන හා ආදර්ශන පැවැත්වීම හා වෙනත් විවිධ කාර්යයන් වෙනුවෙන් නියාමන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, භෝග හා සත්ව නිෂ්පාදන හා නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා සුළු ගොවීන්ට සහාය වීම සහ කෘෂිකාර්මික සංවර්ධනයට පහසුකම් සැපයීම උදෙසා විශේෂිත කෘෂිකාර්මික වැඩ ක්‍රියාත්මක කිරීම යන අරමුණු ඉටු කිරීම පිණිස ගොවි භාරකාර අරමුදල ස්ථාපිත කර තිබුණි. ඉහත අරමුණු ඉටුකර ගැනීම සම්බන්ධයෙන් සිදුකරන ලද පරීක්ෂාවේ දී පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) භාරකාර අරමුදල පිහිටුවා ඇති ප්‍රධාන අරමුණු අතරින් සුළු ගොවීන්ට කෘෂිකාර්මික යෙදවුම් සම්පාදනය හා සත්ත්ව නිෂ්පාදන ක්‍රියාවලිය මෙන්ම නිෂ්පාදනය පිරිසැකසුම් සඳහා අවශ්‍ය වෙනත් අනුග්‍රහයන් ලබාදීම යන කරුණු වැය ඇස්තමේන්තුවට ඇතුලත් කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ මෙම අරමුදල යටතේ ව්‍යාපෘති 41 ක් ඉටුකිරීම වෙනුවෙන් රු.142,360,517 ක මුදලක් ඇස්තමේන්තු කර තිබුණ ද ව්‍යාපෘති 27 ක් පමණක් ආරම්භ කර තිබුණු අතර ඒ සඳහා රු.44,616,377 ක මුදලක් නිදහස් කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසානයේ ව්‍යාපෘතිවල භෞතික හා මූල්‍ය ප්‍රගතිය ඇතුළත් කාර්යසාධන වාර්තාවක් පිළියෙල කර නොතිබුණු අතර සැලසුම් කළ සංවර්ධන වැඩසටහන් 14 ක් විවිධ හේතූන් මත ආරම්භ කර නොතිබුණි.

(ඇ) කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ පවතින ආයතනයන්හි මූල්‍ය අවශ්‍යතා නිවැරදිව හඳුනා නොගැනීම හේතුවෙන් අත්තිකාරම් වෙනුවෙන් වෙන් කරන ලද රු.53,262,500 ක් හා සංශෝධිත ඇස්තමේන්තුව මඟින් කෙටිකාලීන ණය වෙනුවෙන් සංවර්ධන ව්‍යාපෘති 05 කට වෙන්කර තිබූ රු.7,299,700 ක් සමාලෝචිත වර්ෂය තුළ වැය නොකර ඉතිරිවී තිබුණි.

(ඈ) දිගුකාලීන ණය යටතේ ව්‍යාපෘති 05 කට සමාලෝචිත වර්ෂයේදී රු.128,535,580 ක් වෙන්කර තිබුණද ව්‍යාපෘති 03 ක් සඳහා පමණක් රු.38,197,000 ක මුදලක් නිදහස් කර තිබූ අතර වයඹ පළාත් සභාවේ ගොවි බැංකු මඟින් පැළ සිටුවන යන්ත්‍ර ලබාදීම හා යතුරු පැදි ණය ලබා දීමේ ව්‍යාපෘති ක්‍රියාවට නංවා නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේදී වී වේලන කමත් 6 ක් ඉදිකිරීම සඳහා රු.4,060,000 ක් ලබා දී තිබූ අතර, ඒ පිළිබඳ භෞතික පරීක්ෂාවේදී එයින් කමත් 04 ක් නිසි ප්‍රමිතියට සකස්කර නොතිබීම හේතුවෙන් ඇතුලත ඉරිතලා ගොස් තිබූ අතර ජලය බැස යන ආකාරයට මතුපිට ඉදිකර නොතිබීම හේතුවෙන් ජලය එක් රැස්වී තිබුණි. එසේම පෞද්ගලික ඉඩම්වල ඉදිකළ කමත් 02 ක් ද විධිමත් ලෙස රජයට පවරාගෙන නොතිබුණි. තවද කමත් 6 ඉදිකිරීම සඳහා අවශ්‍ය පිරිවිතර පිළියෙල කර නොතිබීම හේතුවෙන් ඒවායේ වර්ග ප්‍රමාණයන් එකිනෙකට වෙනස් වී තිබීම මෙන්ම මිල රේටයන් ද වෙනස් වී තිබූ අතර කමත් වටා ආරක්ෂිත වැටක් ඉදිකිරීම සැළසුම් වලට ඇතුලත් කර නොතිබීම හේතුවෙන් සතුන්ගෙන් සිදුවන හානි වැලැක්වීමටද නොහැකි වී තිබුණු බව නිරීක්ෂණය විය.

(ඊ) 2013 වර්ෂයේ ආරම්භ කර තිබූ ගාල්ල දිස්ත්‍රික්කයේ වක්ගල් මෝදර කරදිය පාලන ව්‍යාපෘතිය හා වවුනියාව හා මොනරාගල දිස්ත්‍රික්කයන්හි සුළු වාරිමාර්ග පුනරුත්ථාපන ව්‍යාපෘති සඳහා පිළිවෙලින් රු.5,000,000 ක් හා රු.19,000,000 ක් වෙන්කර තිබූ අතර ඉන් රු.5,300,000 ක් හා රු.12,118,640 ක් නිදහස් කර තිබුණද සමාලෝචිත වර්ෂය අවසාන වනවිට පිළිවෙලින් රු.2,615,513 ක හා රු.1,744,000 ක වැඩ සඳහා බිල්පත් ඉදිරිපත් කර නොතිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

-------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2002 වර්ෂයේ දී ගොවීන්ගේ භාරකාර අරමුදලට චක්‍රීය අරමුදල සහ කෘෂිකාර්මික භාර අරමුදල ඒකාබද්ධ කිරීමේ දී එම අරමුදල් වල පැවති රු.171,792,093 ක් වූ වත්කම් හා වගකීම් ගොවීන්ගේ භාරකාර අරමුදලට පවරා ගැනීමේ දී විස්තරාත්මක උපලේඛන, ශේෂ සනාථ කිරීම් හා ණයගැති ශේෂ ලැයිස්තු සහිතව එම ශේෂයන් පවරා ගෙන නොතිබුණි. ඒ හේතුවෙන් වරින් වර සමීක්ෂණ මණ්ඩල පත්කර තිබුණද සමාලෝචිත වර්ෂය අවසන් වන තෙක් එම ශේෂ තහවුරු කර ගැනීමට කළමනාකරණය අපොහොසත් වී තිබුණි.

(ආ) ආදායම් බදු බැඳියාවෙන් ආයතනය නිදහස් කරගැනීමට අවශ්‍ය කටයුතු සම්පූර්ණ කර නොතිබීම නිසා සමාලෝචිත වර්ෂය අවසානයට රු.29,665,397ක මුදලක් ගෙවිය යුතු ආදායම් බදු ලෙස වෙන්කර තිබුණද 2017 ජූලි 25 තෙක් එම බදු මුදල් ගෙවීමට කටයුතු කර නොතිබුණු බැවින් ඉදිරියේදී අධිභාරයක් සහිතව ගෙවීමට සිදුවුවහොත් එමඟින් ආයතනයට මූල්‍යමය පාඩුවක් සිදුවීමේ අවදානමක් පවතින බව නිරීක්ෂණය විය.

(ඇ) 2016 පෙබරවාරි 12 දිනැති අංක 02/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 1 (ඇ) (ii) පරිදි වංචාවක් හෝ පවතින ක්‍රමයේ දෝෂයක් හෝ නොමැති කල්හි රු.2,000,000 ක් නොඉක්මවන හානි සම්බන්ධයෙන් ක්‍රියා කිරීමට අමාත්‍යාංශ ලේකම්වරයෙකුට බලය පවරා තිබුණි. නමුත් 2004 / 2005 අත්තිකාරම් වලින් මිලදී ගත් වී වල සිදුවූ හානි සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව පරීක්ෂණ පැවැත්වීම 2015 වර්ෂය දක්වා ප්‍රමාද වීම, ගබඩාවල සහල් ඌනතා සහ විනාශවීම් සිදුවීම, ගොවි සමාගම් අක්‍රිය වන තෙක් ලබා දුන් මුදල් අය කර නොගැනීම වැනි පැවති ක්‍රමයේ දෝෂ හේතුවෙන් ඇති වූ හානි රු.1,461,220 ක් අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතිය මත කපා හැර තිබුණි.

(ඈ) දිස්ත්‍රික් ගොවිජන මධ්‍යස්ථාන වෙත සංවර්ධන කාර්යයන් ඉටු කිරීම වෙනුවෙන් ලබාදෙන අත්තිකාරම්වලට අදාළ පියවීම් වවුචර් අදාළ වර්ෂය අවසන්වීමට පෙර ගෙන්වා ගැනීමට කළමනාකරණයේ අවධානය යොමුකර නොතිබීම හේතුවෙන් ආයතනයේ මූල්‍ය ප්‍රතිඵලයෙන් නිවැරදි තත්ත්වයක් නිරූපණය නොවන බව නිරීක්ෂණය විය.

(ඉ) සුළු ගොවීන් සඳහා කෘෂිකාර්මික ණය සැපයීම ආයතනයේ අරමුණක් වුවද මහා පරිමාණ ව්‍යාපාරික කටයුතු පවත්වාගෙන යන්නෙකු වශයෙන් හඳුනාගත හැකි පුද්ගලයකුට අක්කර 05 ක කාබනික රෙඩ්ලේඩි පැපොල් වගාව සඳහා වසරක නිදහස් කාලයකින් පසුව එළඹෙන වසර දෙක තුළ ගෙවා නිදහස් කිරීමේ පදනමින් කුරුණෑගල ගොවි බැංකුව හරහා 2015 නොවැම්බර් 16 හා 2016 මාර්තු 04 යන දිනයන්හිදී එකතුව රු.1,000,000 ක මුදලක් නිදහස් කර තිබුණි. එමෙන්ම ඇපකරුවන්ගෙන් විධිමත් ඇප සුරැකුම් ලබා ගැනීමකින් තොරව හා ප්‍රථම ණය වාරික මුදල්ද ලැබී නොතිබියදීත් ඒ පිළිබඳ නොසලකා දෙවන ණය වාරිකයද 2016 මාර්තු 04 දින නිදහස් කර තිබුණි. විගණිත දිනය වූ 2017 මැයි 31 දින වන විට ණය ආපසු ගෙවීමේ සහන කාලය ඉක්ම වී ගියද ආයතනයට ප්‍රථම ණය වාරිකය හෝ ලැබී නොතිබුණු අතර ණය අයකර ගැනීමේ වැඩ පිළිවෙත් ක්‍රියාත්මක කර ද නොතිබුණි.

(ඊ) සංවර්ධන ව්‍යාපෘති 04 ක් සඳහා ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්, කෑගල්ල දිස්ත්‍රික් ලේකම් සහ උතුරු පළාත් සභාව වෙත 2014 වර්ෂයේ ලබා දෙන ලද අත්තිකාරම් මුදල් පියවාගැනීමෙන් තොරව, නැවත නැවතත් අත්තිකාරම් ලබා දී තිබූ අතර 2014 වර්ෂය අවසානයට රු.3,999,419 ක් වූ නොපියවූ අත්තිකාරම් ශේෂය සමාලෝචිත වර්ෂය වන විට රු.6,790,587 ක් වී තිබුණි. දෙන ලද අත්තිකාරම් මුදල් කාලීනව පියවා ගැනීමට කටයුතු නොකිරීම හේතුවෙන් පැරණි අත්තිකාරම් ශේෂ අලාභ වශයෙන් කපා හැරීමට සිදු වූ පෙර අත්දැකීම් තිබියදී වර්තමානයේ දීද එලෙස කටයුතු කර තිබුණි.

## 4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අනුරාධපුර දිස්ත්‍රික්කයේ බඩ ඉරිඟු වගා කරන ගොවීන් වෙනුවෙන් ණය ලබාදීම (2015/16 මහ කන්නය) සඳහා 2015 වර්ෂයේ දී ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත රු.90,000,000 ක මුදලක් අරමුදල විසින් ලබා දී තිබූ අතර එයින් ගොවි බැංකු හරහා ගොවීන් 5386 කට රු.15,000 බැගින් කෙටිකාලීන ණය ලෙස රු.80,790,000 ක මුදලක් නිකුත් කර තිබුණි. ණය මුදල වසරක කාලයක් තුළදී පියවිය යුතු බව දන්වා තිබුණද, 2017 මැයි 31 දිනය වන විට ද ගොවි භාරකාර අරමුදලට තවදුරටත් අයවිය යුතු මුදල ලෙස රු.54,012,653 ක් පැවතුණි. ලිපිගොනුව අනුව ගොවීන් වෙත බෙදාදී නොමැති රු.9,210,000 ක මුදලින් තවදුරටත් රු.900,000 ක් අරමුදලට ලැබිය යුතු වුවත් එය 2017 ජූලි 25 දින දක්වාම ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව වෙතින් ගෙන්වා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී කෘෂි ළිං 44 ක් ඉදිකිරීම සඳහා රු.4,000,000 ක ප්‍රතිපාදන වවුනියා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට ලබා දී තිබූ අතර 2017 මාර්තු මාසය තුළ ළිං 15 ක නියැදියක් පරීක්ෂා කිරීමේ දී ප්‍රමාණ පත්‍රයේ සඳහන් ප්‍රමිතීන් හා කොන්දේසි ප්‍රකාරව වැඩ නිම කර නොතිබියදී කෘෂි ළිං 5 ක් වෙනුවෙන් රු.125,809 ක අධි ගෙවීමක් කර තිබුණි.

## 4.4 කාර්ය මණ්ඩල පරිපාලනය

අරමුදලේ කාර්යයන් කරගෙන යාම වෙනුවෙන් කෘෂිකර්ම අමාත්‍යාංශයේ නිළධාරීන් හය දෙනෙකු අනුයුක්ත කර තිබුණු අතර ඉන් නිළධාරීන් දෙදෙනෙකු ගිණුම් හා පාලන කටයුතු කළමනාකරණය වෙනුවෙන් පත්කර තිබුණි. එම දෙදෙනා වෙනුවෙන් වැඩබැලීමේ වැටුප් ලෙස රු.119,445 ක් සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණි. නමුත් ගිණුම් හා පාලන කටයුතු කළමනාකරණය වෙනුවෙන් ස්ථිර නිළධාරීන් අනුයුක්ත කර ඔවුන් වෙත වගකීම් නොපැවරීම හේතුවෙන් ණය අයකර ගැනීමේ ප්‍රගතිය පහළ මට්ටමක වීම, නොපියවූ අත්තිකාරම් පැවතියදී නැවත නැවතත් අත්තිකාරම් ලබා දීම, ණය අයකර ගැනීමේ කාල ප්‍රමාදය, අය නොවන ණය කපා හැරීමට ලක් කිරීම, ණය ලේඛන නිසි පරිදි යාවත්කාලීන නොවීම හා ලිපිගොනු පවත්වාගැනීම සතුටුදායක මට්ටමක නොවීම වැනි දුර්වලතා ඇති වී තිබුණි.

# 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

## 5.1 ක්‍රියාකාරී සැලැස්ම

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03 (ආ) ඡේදය ප්‍රකාර, සමාලෝචිත වර්ෂයට අදාල වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

## 5.2 අයවැය ලේඛනමය පාලනය

අයවැයගත සහ තථ්‍ය ආදායම හා වියදම අතර සියයට 15 සිට සියයට 100 දක්වා විචලනයන් වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර අමාත්‍යාංශ ලේකම්වරයාගේ අවධානය සඳහා යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමුවිය යුතුවේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) ලැබිය යුතු ණය ශේෂ | ණය ශේෂ අයකර ගැනීමේ ප්‍රමාදය සහ හඳුනා නොගත් ණය ශේෂ සම්බන්ධයෙන් කටයුතු කිරීමේ ප්‍රමාදයන් පැවතීම. |
| (ආ) ණය කළමනාකරණය | ආයතනයේ අරමුණුවලට පටහැනි ලෙස ණය ලබා දීම, ගිවිසුම් අසම්පූර්ණ වීම, ණය ලබාදීමේ ක්‍රමවේදය හා පොළී ප්‍රතිශතය සම්බන්ධව පොදු ප්‍රතිපත්තියක් නොවීම, ණය මුදලේ උපරිම සීමාව හා ඇප තැබීම පිළිබඳ දුර්වලතා පැවතීම. |
| (ඇ) කොන්ත්‍රාත් පරිපාලනය | සැලසුම් කරන ලද කාලය තුළ ව්‍යාපෘති නිම නොකිරීම, ව්‍යාපෘතිවල පසු විපරම් කටයුතු සිදු නොකිරීම, නිවැරදි ඇස්තමේන්තු පිළියෙල නොකිරීම, අසම්පූර්ණ ගිවිසුම් මත අත්තිකාරම් ලබා දීම, ප්‍රගති වාර්තා සකස් නොකිරීම. |
| (ඇ) අත්තිකාරම් ලබාදීම | සංවර්ධන ව්‍යාපෘති සඳහා විවිධ ක්‍රියාකාරී ආයතන වෙත ලබා දී ඇති අත්තිකාරම් වර්ෂයේ අවසාන දිනය වනවිට පියවීමට කටයුතු කර නොතිබීම. |